
# 1 ඉතිහාසය හඳුන්වාදීම

**මෙම ඒකකයෙන් ඉතිහාසය යනු කුමක් දැයි පහදගෙන, එම විෂය ඉගෙනීමෙන් අත්වන ප්‍රයෝජන පිළිබඳව අධ්‍යයනයට යොමුවෙමින්, ඉතිහාසය ඉගෙනගත හැකි මූලාශ්‍ර පිළිබඳ ව ද අවබෝධයක් ලබා ගනිමු.**

## ඉතිහාසය යනු,

- අතීතය හා වර්තමානය අතර නොනවතින සංවාදයකි.
- අතීතයේ කළ කී දෑ
- මානව සමාජ විකාශනයේ කතන්දරයයි.

මිනිසා විසින් කරනු ලබන සෑම දෙයක් ම පාහේ ඉතිහාස විෂය ක්ෂේත්‍රයට ඇතුළත් වේ. දේශපාලන, ආර්ථික හා නීතිමය අංශ පමණක් නොව විද්‍යාත්මක සංවර්ධනයත්, සාහිත්‍යය හා කලා අංශත් ඊට ඇතුළත් ය.




1.1 රූපය

**ගංගා නිම්න ආශ්‍රිත ව ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස බිහි වී ඇත. ආර්යයන් කෘෂිකාර්මික දිවි පෙවතකට හුරු වූ අය වීම එයට හේතුව වශයෙන් දැක්විය හැකි ය. මේ නිසා ඔවුහු කෘෂිකාර්මය සඳහා අවශ්‍ය සරුපස, ජල පහසුව, තැනිතලා බිම යන කරුණු ජනාවාස ඉදිකර ගැනීමේ දී සැලකිල්ලට ගත්හ.**



1.1 සිතියම - ශ්‍රී ලංකාව ජනාවාස වීම

එක් එක් විෂයයක් පිළිබඳ විශේෂ ක්‍රම හා විස්තරාත්මක දැනුම නොව, සාමාන්‍ය හැඳින්වීමක්, පිවිසීමක් ඉතිහාසය විෂයෙන් ලබාගත හැකි ය. **ඉතිහාසය එක් විෂයයක් නොව විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහය** ලෙස ජී.එම්. ට්‍රෙවිලියන් නම් ඉතිහාසඥයා ප්‍රකාශ කර ඇත.

- ඉතිහාසය හා භූගෝල විද්‍යාව අතර සම්බන්ධතාව : ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම පිළිබඳව අතීත කරුණු අධ්‍යයනය කිරීමේදී එයට සම්බන්ධ භූගෝලීය පසුබිම පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. තවත් නිදසුනක් ලෙස කන්ද උඩරට රාජධානියේ ස්වාධීනව පැවතීමට හේතුව එහි භූගෝලීය පිහිටීම බව දැකිවිය හැකි ය.
- ඉතිහාසය හා දේශපාලන විද්‍යාව අතර ඇති සම්බන්ධතාව : ඉතිහාසය ද අතීත දේශපාලනයට අයත් වේ. වර්තමාන දේශපාලනය අනාගත ඉතිහාසයයි. එය ඉතා ම කිට්ටු සම්බන්ධතාවකි.
- එමෙන් ම ඉතිහාස පාඩමේ දී ඒ යුගයන්ට අදළ ආර්ථික, සමාජ හා සංස්කෘතික තොරතුරු පිළිබඳ අධ්‍යයනය කරනු ලබයි. ඒ අනුව ඉතිහාසය, විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහය ලෙස හැඳින්වීම වඩාත් උචිත වේ.

### ක්‍රියාකාරකම

- ඉතිහාසය විෂය පිළිබඳ ව ලියවී ඇති නිර්වචන එකතු කරන්න.
- ඉතිහාසය යනු කුමක් දැයි පොදු නිර්වචනයක් ගොඩනගන්න.

## ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන

ඉතිහාස පාඩම් ආශ්‍රයෙන් තමන් වසන සමාජය, රට සහ ලෝකය පිළිබඳ ව අධ්‍යයන කිරීමට සිසුන්ට අවස්ථාව ලැබේ. මෙම අවබෝධයෙන් තොර ව වත්මන් සමාජයේ යහපත් පුරවැසියෙකු සේ ජීවත් වීම දුෂ්කර ය. එබැවින් තම සංස්කෘතිය, රට සහ ලෝකය පිළිබඳ නිවැරදි අවබෝධයෙන් ජීවත් වීමට හැකියාව ඉතිහාස අධ්‍යයනයෙන් ලැබේ.

''තමා වසන සමාජය පිළිබඳ නොදන්නා, ලෝකයෙහි තම සමාජයට සහ තමාට හිමි තැන ගැන අවබෝධයක් නොමැති පුද්ගලයා, ඡන්ද බලය තිබුණත් නිදහස් පුද්ගලයකු නො වන්නේ ය.''

- ලන්ඩනයේ අධ්‍යාපනය පිළිබඳ මධ්‍යම උපදේශක මණ්ඩලයේ "අපේ අනාගතයේ හරි අඩක් නම්" වාර්තාව ඇසුරිනි-

''වර්තමානය හා අනාගතය අනිවාර්යයෙන් ම අතීතයෙන් ගොඩනැගෙන අතර, එම මුද්‍රාව එහි දක්නට ලැබෙනු ඇත. එය අමතක කිරීම අත්තිවාරමක් නොමැති ව කරන ඉදිකිරීමක් වැනි ය.''

-ශ්‍රී ජවහර්ලාල් නේරු-


"වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය තේරුම්ගත යුතු ය" - ඊ.එච්. කාර් -

ඉහත ප්‍රකාශ අනුව බලන විට කවර හෝ දෙයක වර්තමාන තත්ත්වය, ආසන්න හෝ දුර අතීතයක ප්‍රතිඵලයකි. වර්තමාන සමාජය, ලෝකයේ ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයකි. වර්තමානය මෙන් ම අනාගතය ගොඩනගා ගැනීමේ පදනම වැටී ඇත්තේ අතීතයේ කළ කී දේ මතයි. ඒ අනුව අතීතය මනා ව හැදෑරීමෙන් වර්තමානය අවබෝධ කර ගැනීම නිසා අනාගතය ගොඩනගා ගැනීමට අවශ්‍ය පදනම සකස් කර ගත හැකි ය. නමුත් ඉතිහාසඥයාට ශාස්ත්‍රකරුවන් මෙන් අනාවැකි පළ කළ නො හැකි ය.

**නිදසුන් :**

| | |
|---|---|
| අනාවැකි | වයස අවුරුදු 40 දී ඔබ ශ්‍රී ලංකාවේ ජනාධිපති වෙයි. |
| ඉතිහාසඥයා | ඔබ මහන්සි වී උනන්දුවෙන් හා බාධක ජය ගෙන කටයුතු කළහොත් රටේ නායකයා වීමට හැකි වනු ඇත. එසේ කැප වී ක්‍රියා කර නායකත්වයට පත් පුද්ගලයන් පිළිබඳ තොරතුරු බොහෝ ඇත.<br>උදා : පළමුවන විජයබාහු රජු, ඒබ්‍රහම් ලින්කන් මහතා, නෙල්සන් මැන්ඩෙලා මහතා. |

1. තමා ජීවත් වන සමාජය හා ලෝකය පිළිබඳ ව පැහැදිලි ව අවබෝධයක් ලබා ගැනීමට
2. අතීතය ආශ්‍රයෙන් වර්තමානය තේරුම්ගෙන අනාගතය ගොඩනගා ගැනීමට
3. රටේ අනාගත නායකත්වය භාරගැනීම සඳහා සුදුනම් වන සිසුනට දේශපාලන සිදුවීම් හා බලවේග පිළිබඳ ව අවබෝධ කර ගැනීමට




**1.2 රූපය - ඉතිහාසය නම් වෘක්ෂයේ එල**

4. ජාතික අනන්‍යතාව හඳුනාගැනීමට
5. අන් සංස්කෘතීන්ට ගරු කිරීමට
6. විවිධ මත ඉවසීමට
7. ජාතික සමගිය ගොඩනැගීමට
8. කාලය හා අවකාශය පිළිබඳ අදහස වර්ධනයට
9. විවේචනාත්මක චින්තනයේ වර්ධනයට

ඉතිහාස පාඩම් ආශ්‍රයෙන් අතීත රජවරුන්, නායකයන් සහ ඔවුන්ගේ පාලන ක්‍රම ආදී කරුණු අධ්‍යයනට යොමු කෙරෙයි. අනෙක් කිසි ම විෂය අධ්‍යයනයකට වඩා අද ලෝකයේ දේශපාලන සිද්ධීන් හා බලවේග අවබෝධ කරගැනීමට ඉතිහාසය උපකාරී වෙයි. එසේ නම් හෙට පාලන තන්ත්‍රය මෙහෙයවීමට සිටින, රටේ නායකත්වය භාරගැනීමට සුදනම් වන වත්මන් ශිෂ්‍යයන්ට ඒ සඳහා හැඩගැසීමට ඉතිහාසය මග පෙන්වනු ඇත.

**නිදසුන් :** ඉතා උසස් ගණයේ දේශපාලනඥයකු ලෙස පිළිගැනෙන ඉන්දියාවේ ප්‍රථම අගමැති ශ්‍රී ජවහර්ලාල් නේරු තුමන් හා රටේ බලය, කීර්තිය, ස්වාධිපත්‍ය රැකගත් බ්‍රිතාන්‍ය අගමැතිවරයකු ව සිටි වින්ස්ටන් චර්චිල් මහතා ද දක්ෂ ඉතිහාසඥයන් ලෙස පිළිගැනේ.

ඉතිහාසය ඉගෙනීම ආශ්‍රයෙන් තමන් අයත් රටෙහි ජාතික අනන්‍යතාව හඳුනාගැනීමට හැකි ය. ජාතික අනන්‍යතාව හඳුනාගත් විට ජාත්‍යාලය වර්ධනය වේ. එය රටක ඉදිරි ගමනට රුකුලකි. රටක නිවැරදි ඉතිහාසය ඉගෙනගැනීම ජාතික සමගිය වර්ධනයට ද රුකුලකි. වෙනත් රටවල ඉතිහාසය හා සංස්කෘතීන් පිළිබඳ ඉගෙනීමෙන් අනෙකුත් සංස්කෘතීන්හි වටිනාකම් හඳුනාගෙන ක්‍රියා කිරීමට හැකියාව ලැබේ.

මිනිසාගේ පරමාර්ථ, අත්දැකීම්, ප්‍රශ්න හා ජයග්‍රහණ පිළිබඳ තොරතුරු වර්තාවක් ඉතිහාසයෙන් ලැබේ. ඒ අනුව මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳ හඳුනාගැනීමෙන් තමා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමටත්, ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් හැකි වේ. එමෙන් ම විවිධ මත ඉවසීම, අන්‍යෝන්‍ය ගෞරවය වැනි ගුණාංග ද වර්ධනය කරගත හැකි ය.

මෙරට ජනගහනය සෑදී ඇති විවිධ ජන කොටස්වලට අයත් පුද්ගලයන් රටේ යහපත උදෙසා ජාති, ආගම්, භේදයකින් තොර ව ක්‍රියා කර ඇති ආකාරය වත්මන් පරපුරට ආදර්ශයකි. උදහරණ ලෙස නිදහස් ව්‍යාපාරය වැනි තේමා ඉදිරිපත් කිරීමෙන් ජාතික සමගිය ගොඩනැගීමට ආධාර වී ඇති බව පෙන්විය හැකි ය.

කාලය හා අවකාශයෙන් තොර ඉතිහාසයක් නැත. පැරණි ඉතිහාසය ලිවීමේ දී පවා මේ කරුණු දෙක පිළිබඳ ව සැලකිලිමත් වූ බව මහාවංශ වැනි වංශ කථා පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ.

**නිදසුන් :** **අශෝක රජුගේ අභිෂේකය බුද්ධ පරිනිර්වාණයෙන් වසර 218කට පසු සිදු වූ බව දීපවංශයේ හා මහාවංශයේ සඳහන් වී ඇත. මෙය ලංකාවේ හා ඉන්දියාවේ ඉතිහාසය පිළිබඳ කාල නිර්ණයට බෙහෙවින් ආධාර වී තිබේ.**

- ඉතිහාසයේ මෙවැනි අතිවිශේෂ දින හා සම්බන්ධ කොට බුද්ධ වර්ෂය, ශත වර්ෂය, ක්‍රිස්තු වර්ෂය වැනි වර්ෂ ක්‍රම භාවිතය ඇති වී තිබේ. ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තිය සම්බන්ධ කර ක්‍රිස්තු වර්ෂය ආරම්භ වේ. අද බහුල ව භාවිත වන මෙම ක්‍රමය අනුව යම් සිද්ධියක් සිදු වූයේ ක්‍රි.ව. පෙර හෝ ක්‍රි.ව. පසු ව ලෙස ව්‍යවහාර වේ.
- අවකාශය යනු අවට තිබෙන භෞතික පරිසරයයි. රටක ඉතිහාසය කෙරෙහි එරට භෞතික පරිසරය, භූගෝලීය සාධක බෙහෙවින් බලපායි. ඒ අනුව පිහිටීම, දේශගුණය, ගංගා ඇළ දොළ, සමුද්‍ර, කඳු, ආදිය පිළිබඳ ඉතිහාස පාඩමේ සිතියම් ඇසුරින් අධ්‍යයනය කිරීම අවකාශය පිළිබඳ අවබෝධය වර්ධනයට රුකුලකි.
- ඕනෑ ම අතීත සිදුවීමක්, අවස්ථාවක් සම්බන්ධ සත්‍ය තත්ත්වය සොයා බලා සත්‍ය බවට හෙළි කර ගත හැකි වුවහොත් පමණක් එහි ඉතිහාසගත තොරතුරක් ලෙස සැලකේ.

  ඒ අනුව යම්කිසි දෙයක් ඇසූ පමණින් පිළිනොගෙන ඒ පිළිබඳ ව සොයා බලා සත්‍ය වටහා ගැනීමේ පුරුද්දක් ඉතිහාසය හැදෑරූ පුද්ගලයා තුළ ඇති වේ. එය ප්‍රචාරයන්ගෙන් මංමුලා නොවී ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වනු ඇත. එපමණක් නොව විවේචනාත්මක ව සිතා බැලීමේ හැකියාව තුළින් අනවශ්‍ය දේ අතුරින් තමන්ට අවශ්‍ය දේ පමණක් තෝරා ගැනීමේ හැකියාව ද වර්ධනය වනු ඇත. එනම්, සත්‍ය හා ප්‍රචාරය අතර වෙනස වටහා ගැනීම යි.

  ලංකාවේ පැරණි ඉතිහාසය හැදෑරීම සඳහා සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය රැසක් ඇත. වසර 2500 වඩා පැරණි අඛණ්ඩ ලිඛිත ඉතිහාසයක් ලංකාව සතු වීම භාග්‍යයකි.

**ක්‍රියාකාරකම්**

✍ ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් අපට ලබාගත හැකි ප්‍රයෝජන මැයෙන් රචනාවක් ලියන්න

**ඓතිහාසික මූලාශ්‍රය :**


යම් කාලයක හෝ දේශයක ඉතිහාසය නිවැරදි ව අවබෝධ කර ගැනීම සඳහා දැනට ශේෂ ව තිබෙන ඊට අදළ මූලාශ්‍ර විග්‍රහ කර බැලීම අවශ්‍ය වේ. මෙම මූලාශ්‍රය සාහිත්‍යමය සහ පුරාවිද්‍යාත්මක වශයෙන් ප්‍රධාන කොටස් 2ක් යටතේ අධ්‍යයනය කළ හැකිය.

**සාහිත්‍යමය මූලාශ්‍රය :**

මෙය කොටස් දෙකකි. එනම් දේශීය හා විදේශීය මූලාශ්‍රය නම්නි. ලංකා ඉතිහාසය හැදෑරීමට හැකි දේශීය මූලාශ්‍රය කිහිපයක් මෙහි දක්වේ.
උදහරණ : (දීපවංශය, මහාවංශය, මහාවංශයේ දෙවැනි කොටස, දථාවංශය, බෝධිවංශය)

දේශීය මූලාශ්‍රය :

ලංකා ඉතිහාසයේ පළමුවෙන් ම ලියවී ඇති මූලාශ්‍රය ලෙස දීපවංශය හැඳින්විය හැකි ය. මෙය ක්‍රි.ව. පස්වන සියවසට පෙර රචනා වූවක් ලෙස සැලකේ. මෙම කෘතිය මගින් මහසෙන් රජු දක්වා තොරතුරු අඩංගු වේ.




ක්‍රි.ව. හයවන සියවසේ පමණ මහාවිහාරික භික්ෂූන් වහන්සේ නමක් වූ මහානාම හිමි විසින් රචනා කරන ලද මහාවංශය දීපවංශයට වඩා උසස් සාහිත්‍ය කෘතියකි. දීපවංශයේ ඇති බොහෝ අඩුපාඩු මහහැර ලංකාවේ අවුරුදු 2500ට වඩා පැරණි අඛණ්ඩ ලිඛිත ඉතිහාසයක් ගොඩනගා ගැනීමට මහාවංශය උපකාරී වෙයි. එය එතෙක් තිබූ අට්ඨ කථා, පිංපොත් ආදිය ද උපයෝගී කර ගනිමින් රචනා කර ඇත. මහාවංශයේ එන බොහෝ කරුණු ශිලාලේඛනවලින් තහවුරු වීම ඓතිහාසික මූලාශ්‍ර අතර අද්විතීය ස්ථානයක් මහාවශංයට හිමි වේ. මෙම කෘතිය තුළ ලෞකික ප්‍රවෘත්ති අඩංගු වුවත්, එහි කර්තෘ, නිතර ම අවධානය යොමුකර ඇත්තේ ආගමික ඉතිහාසය වෙතයි. ඒ නිසා පැරණි දේශපාලන තන්ත්‍ර හා ආර්ථික රටාව පිළිබඳ තොරතුරු සියල්ල ම මෙහි දක්වා නැත. මහාවංශයේ පළමු කොටස මහසෙන් රජුගේ රාජ්‍ය කාලයෙන් අවසන් වේ. එසේ මහාවංශය නතර කළ පරිච්ඡේදයේ සිට නැවත කොටස් වශයෙන් එම කෘතිය දිගට ම රචනා කර ගෙන ගොස් ඇත. ඒ අයුරින් මහාවංශයේ දෙවන කොටස රචනා කර ඇත. ඇතැමුන් එය චූලවංශ නමින් හැඳින් වුවත් එය රචිත කර්තෘන් චූලවංශය නමින් තම කෘතිය හඳුන්වා නොමැත. ඔවුන්ට අනුව එම කෘතිය මහාවංශයේ දෙවන කොටසයි. එහෙත් මෙම කෘතිය රචනා කර ඇත්තේ මහාවංශය ලියා නිම කර ශතවර්ෂ ගණනාවකට පසු ව බැවින් මහාවංශය ම ලෙස හඳින්වීමට ද නො හැකියි. කෙසේ වෙතත් මහාවංශයට පසු අඛණ්ඩ ලිඛිත ඉතිහාසයක් ගොඩනගා ගැනීම සඳහා මෙම කෘතිය මගින් විශාල මෙහෙයක් ඉටු වේ.

ඉන්දියාවේ පැවැති බුදුදහම හා ලංකාවට බුදුදහම ගෙන ඒම පිළිබඳ විස්තර අඩංගු සමන්තපාසාදිකාව ද ලංකා ඉතිහාසය ගොඩනැගීමට උපකාරී වන ග්‍රන්ථයකි. මෙය විනය පිටකයට පාලියෙන් ලියන ලද අට්ඨකථාවයි. මීට අමතර ව අනුරාධපුර ශ්‍රී මහා බෝධියේ ඉතිහාසය අළලා ලියවුණු මහාබෝධිවංශය, දළඳ වහන්සේගේ ඉතිහාසය, ලියා ඇති පාලි දඨාවංශය සහ දළඳ සිරිත, ථූපවංශය, ධාතුවංශය, පූජාවලිය, නිකාය සංග්‍රහය, රාජරත්නාකරය, රාජාවලිය, වැදගත් ඓතිහාසික මූලාශ්‍රයෝ වෙති.

මීට අමතර ව එක් එක් යුගවල දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික තොරතුරු ලබාගත හැකි සාහිත්‍ය කෘති රැසක් ඇත. එම මුලාශ්‍රවලින් කිහිපයක් පහත දැක්වේ.

| යුගය | මූලාශ්‍රය |
| --- | --- |
| අනුරාධපුර යුගය | දම්පියා අටුවා ගැටපදය, හෙරණසික, සිඛවළඳ විනිස, සියබස්ලකර |
| පොළොන්නරු යුගය | මුවදෙව්දවත, සසදවත, ධර්මප්‍රදීපිකාව, රසවාහිනිය |
| දඹදෙණි යුගය | සද්ධර්මරත්නාවලිය, පූජාවලිය |
| කුරුණෑගල යුගය | ජාතක කථා පොත, සිංහල බෝධි වංශය, නිකාය සංග්‍රහය |
| කෝට්ටේ යුගය | සන්දේශ සාහිත්‍ය කෘති හා ගුත්තිල කාව්‍ය |

මෙම කෘති යම්කිසි නිමිත්තක් අනුව රචනා වී ඇති බැවින් එහි එන කරුණු ප්‍රවේශමෙන් අධ්‍යයනය කළ යුතු ය. බොහෝ විට ප්‍රධාන මූලාශ්‍රවල තොරතුරු තහවුරු කර ගැනීමට ද මේවා උපකාරී කර ගත හැකි ය.

## විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය :

විදේශීය මූලාශ්‍රවල වටිනාකම රැඳී ඇත්තේ විශේෂයෙන් වෙළෙහෙළඳම් හා අන්තර්ජාතික සම්බන්ධතා ගැන ඒවායෙහි ඇතුළත් ඓතිහාසික තොරතුරු මත ය. ලංකාව අතීතයේ සිට ම ඉන්දියාව, චීනය, බුරුමය, මලය අර්ධද්වීපය, පර්සියාව, අරාබිකරය, ග්‍රීසිය, රෝමය වැනි පෙර අපර දෙදිග රටවල් සමග සබඳතා පැවැත් වී ය. මේ නිසා ලංකාව පිළිබඳ විදේශීය ලේඛකයන් විසින් ලියන ලද විවිධ සටහන් හමු වී ඇත.

ලංකාව පිළිබඳ තොරතුරු සටහන් වන වැදගත් කෘතියක් ලෙස ඇරිස්ටෝටල් විසින් රචිත "ඩිමුන්ඩෝ" නම් කෘතිය හැඳින්විය හැකි ය. එහි ලංකාව හා වයඹ දිග ඉන්දියාව අතර වෙළඳ සබඳතා පැවැත්වූ බව දක්වා ඇත. ග්‍රීක ජාතික මෙගස්තිනීස්ගේ "ඉන්ඩිකා" නම් කෘතියක ද ලංකාව ගැන සටහන් ව ඇත. මෙගස්තිනීස් චන්ද්‍රගුප්ත රජුගේ රාජසභාවේ සිටි ග්‍රීක තානාපතිවරයායි. රෝම ජාතික ප්ලීනිගේ "නැචුරාලිස් හිස්ටෝරියා" නම් කෘතියේ ලංකාවේ ආර්ථික තොරතුරු දක්වා ඇත. "පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී " නම් පළමුවන ශත වර්ෂයට අයත් කෘතියක ලංකාවේ මුතු, මැණික් හා කපු පිළි තිබූ බව සටහන් වී ඇත. ලංකාව පිළිබඳ ව වඩාත් නිවැරදි තොරතුරු දැක්වීමට හැකි වූ විදේශිකයා ලෙස ක්‍රි.ව. දෙවන සියවසේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ ටොලමි හඳුන්වා දිය හැකිය.ඔහුගේ භූගෝල ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ ලංකාවේ ස්ථාන නාම, ස්ථාන, ඒවායේ පිහිටීම හා ලංකාවේ හැඩය පිළිබඳවත් වඩා නිවැරදි තොරතුරු අන්තර්ගත වී ඇත.

ක්‍රි.ව. 6වන සියවසේ විසූ රෝම ඉතිහාසඥයෙකු වූ ප්‍රොකෝපියස් විසින් "පර්සියානු යුද්ධ" නම් කෘතියේ ලංකාව සුප්‍රසිද්ධ වෙළෙඳ මධ්‍යස්ථානයක් ව පැවති බවට සඳහන් කර ඇත. මෙම කරුණු ම කොස්මස් විසින් ටොපෝග්‍රැපියා ක්‍රිස්ටියානා නම් කෘතියෙහි සඳහන් කර ඇත.

ක්‍රි.ව. 9වන සියවසේ විසූ අරාබි ජාතික සුලයිමාන් විසින් ලංකාව "සෙරන්ඩිබ්" යන නමින් හඳුන්වා ඇත. ඔහුගේ තොරතුරු ඇසුරින් අබුසයිද් නම් රචකයා විසින් "සිල්සිලාත් - අල් - තවාරිං" නමැති ග්‍රන්ථයේ ලංකාව ගැන සඳහන් කර ඇත. අරාබි ජාතික ඉබන් බතූතා ලංකාව හා අරාබිය අතර පැවති වෙළෙඳ සබඳතා පිළිබඳ සඳහන් කර ඇත.

ලංකාව ගැන ලියූ චීන ජාතිකයන් අතර මුල් තැනක් පාහියන් හා හියුංත්සාං යන හිමිවරුන්ට ලැබේ. ලංකාවේ මහායාන බලපෑම්, මහාවිහාරය හා අභයගිරිය, පිළිබඳ තොරතුරු පාහියන් හිමියන් විසින් දක්වා ඇත. ලංකාව පිළිබඳ තොරතුරු ලියූ අනෙකුත් චීන ජාතිකයන් ලෙස හු-ජ්-චෝ, චාඕ-ජු - කුවා වැදගත් වේ. දීපවංසය හැරුණු විට ලංකාවේ භික්ෂුණීන් පිළිබඳ සැලකිය යුතු විස්තරයක් චීන ජාතිකයන්ගේ කෘති අසුරින් ලබා ගත හැකි ය. ඉන්දියානු ග්‍රන්ථ අතර කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයේ තාම්‍රපර්ණි සහ "පාර සමුද්‍ර" යන නම්වලින් ලංකාව හඳුන්වා ඇත. මහාභාරතය. මණිමේඛලා, රාජතරංගණිය වැනි ග්‍රන්ථවල ලංකාවේ රෙදිපිළි හා මැණික්, වාරි කර්මාන්තය ආදිය ගැන සටහන් වේ. ලංකාවතාර සූත්‍රය හා රාමායණය වැනි ග්‍රන්ථවල ලංකාව පිළිබඳ තොරතුරු ඇත. මීට අමතර ව දිව්‍යාවදානය, ස්කන්ධපුරාණය සිලප්පදිකාරම්, මණිමේකලෛ, පත්තුප්පාට්ටු, පට්ටිනප්පාලෛ වැනි ද්‍රවිඩ ග්‍රන්ථවල ද ලංකාව ගැන සඳහන් වේ.



සිතියම 1.2 - ටොලමිගේ ලංකාව


ඉහත දැක්වූ විදේශීය මූලාශ්‍රය ක්වේරෝස් නොක්ස් වැනි විදේශීය වාර්තාකරුවන් විසින් ලියන ලද කෘතීන් තරම් විස්තරාත්මක නොවුණත් වෙළඳාම සම්බන්ධ තොරතුරු සඳහා මේ මූලාශ්‍රය වැදගත් වේ.

## පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර කොටස් තුනකට බෙදේ. එනම්, සෙල්ලිපි කාසි හා නටබුන් ය.

## සෙල්ලිපි

සෙල්ලිපි කොටස් කිහිපයකි. එනම් ලෙන් ලිපි, ගිරි ලිපි, පුවරු ලිපි හා ස්තම්භ හෙවත් ටැම් ලිපි වශයෙනි. ලංකාවේ සෙල්ලිපි දක්නට ලැබෙන්නේ මහින්දාගමනයෙන් පසු අක්ෂර මාලාවක් ලැබීමෙන් පසුව ය. ඒ අනුව මෙම මුල් ම ලිපි බ්‍රාහ්මී අක්ෂරවලින් ලියා ඇත.



රූපය 1.3
පැරණි සිංහල ශිලා ලේඛනවල ආදර්ශ

| | | |
|---|---|---|
| **ලෙන් ලිපි** | - | ලංකාවේ විවිධ ස්ථානවල ඇති ලෙන්වල කටාරමට ඉහළින් ලියා ඇත.<br>උදා : මිහින්තලය, වෙස්සගිරිය, සිතුල්පව්ව, රිටිගල. |
| **ගිරි ලිපි** | - | ගල්වල ලියා ඇත<br>උදා : ගඩලාදෙණියේ ද්විභාෂා ලිපිය, අලවල අමුණ ලිපිය, |
| **පුවරු ලිපි** | - | උදා: පොළොන්නරුවේ ගල්පොත ශිලා ලේඛනය, මිහින්තලා පුවරු ලිපිය, තෝනිගල සෙල්ලිපි. |
| **ටැම් ලිපි** | - | බදුලු ටැම් ලිපිය, කටුගහගල්ගේ ලිපිය. |

ඓතිහාසික මූලාශ්‍රය වශයෙන් සෙල්ලිපිවලට හිමි වන ස්ථානය ඉතා ඉහළ ය. සාහිත්‍යමය මූලාශ්‍රවල සඳහන් කරුණු බොහෝ දුරට සෙල්ලිපි මගින් තහවුරු කරගත හැකි ය.

එ මෙන්ම, සෙල්ලිපිවල අන්තර්ගත කරුණු අදාළ සිද්ධීන්ට සමකාලීන වීම ද වැදගත් ය.

උදා : දසමහා යෝධයන් ගැන මහාවංශයේ එන පුවත සිතුල්පව්ව හා සංඛපාල විහාර සෙල්ලිපිවලින් සනාථ වේ.

මුල් කාලයේ සෙල්ලිපි ඉතා කෙටි ඒවා විය. කිසිවකු විසින් භික්ෂූන්ට කරන ලද පරිත්‍යාගයක් සටහන් කර තැබීම මෙම ලිපිවල දක්නට ලැබේ. ක්‍රි.ව. දෙවන සියවසින් පසු ලියන ලද ගිරි ලිපිවල හා ටැම් ලිපිවල ඊට වඩා දීර්ඝ විස්තරයක් ඇත. ක්‍රි.ව. 8වන සියවසින් පසු හමුවන සෙල්ලිපිවල රජවරුන් පිළිබඳ කරන ලද වර්ණනා දක්නට ලැබේ.

මෙම සෙල්ලිපි මගින් සිංහල අක්ෂරවල විකාශනය, නොයෙක් සංකේත, සිංහල ව්‍යාකරණ, රජුන්ගේ නම්, රාජකීය විරුද නාම, ප්‍රාදේශීය රජුන් හා කුමාරවරුන්, බ්‍රාහ්මණ, පරුමක, ගමික, ගපති හා වෙනත් එවැනි ප්‍රභූන් පිළිබඳ තොරතුරු රැසක් හෙළි වේ. තව ද රාජ්‍ය නිලධාරින් හා එවක පැවැති වෙළඳාම, රැකී රක්ෂා හා ආර්ථික තත්ත්වය, ඉඩම් භුක්තිය. බදු ක්‍රම වැනි කරුණු පිළිබඳ ව සාහිත්‍යමය මූලාශ්‍රයවලින් සොයා ගත නොහැකි ඇතැම් තොරතුරු ද හෙළි වේ.

උදා : සමකාලීන වෙළඳාම පිළිබඳ බදුලු ටැම් ලිපියෙහි සඳහන් වේ.

ආගමික ඉතිහාසය සම්බන්ධ තොරතුරු ද සෙල්ලිපිවලින් අනාවරණය වේ. එනම්, භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස පිළිබඳ ව බෞද්ධාගමික තොරතුරු ද වෙනත් ආගමික විශ්වාස හා පුදසිරිත් ද පිළිබඳ ව ය. මීට අමතර ව විහාර ආරාම පාලනය, විහාර ආරාම සතු ගම්බිම් සහ පුද පූජා වරප්‍රසාද ආදී කරුණු තේමාකර ලියවුණු සෙල්ලිපි ද වේ.

උදා : ආරාම පාලනය ගැන මිහින්තලා පුවරු ලිපිය, අභයගිරි සංස්කෘත ලිපිය, කළුදිය පොකුණ ලිපිය වැනි සෙල්ලිපිවල කරුණු සඳහන් වේ.

සෙල්ලිපිවල ව්‍යාප්තිය, ජනාවාස ව්‍යාප්තිය හා බුද්ධාගමේ ව්‍යාප්තිය පිළිබඳ ව දැනගැනීමට ද උපකාරී වේ. එසේ ම රජවරුන්ගේ පාලන බලය කොතෙක් දුරට පැතිර තිබුණේ ද යන්න තේරුම් ගැනීමට ද සෙල්ලිපි උපකාරී වේ.

**නිදසුන් :** අභිලේඛනයක් වූ වල්ලිපුරම් රන් සන්නසට අනුව වසභ රජුගේ පාලනය ලංකාවේ උතුරු ප්‍රදේශයේ පැතිර තිබූ ප්‍රමාණය දැන ගැනීමට හැකි වීම.

උප රජුන් හා ප්‍රාදේශීය රජුන් පිළිබඳ ව සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් නොවන තොරතුරු රැසක් සෙල්ලිපි මගින් හෙළි වේ. කුසලාන්කන්ද, හෙන්නන්නේගල, බඹරගල, යටහලෙන, ආදී ලිපිවල එවැනි තොරතුරු අඩංගු වේ. කදුරුවැව ලිපියෙහි ඇමැති පරම්පරා පහක් ගැන සඳහන් වේ.

එසේ ම වෙළෙඳාම හා අධිකරණ තොරතුරු ද සෙල්ලිපිවලින් හෙළි වේ.

**නිදසුන් :**

| | |
|---|---|
| **ගොඩවාය ටැම් ලිපිය** | - ගොඩපවත වරායෙන් ලබාගත් අයබදු පිළිබඳ |
| **බදුලු ටැම් ලිපිය** | - වෙළෙඳපොළක පාලනය පිළිබඳ ව |
| **පෙරිමියන්කුලම් ලිපිය** | - වෙළෙඳ ශ්‍රේණි හා කර්මාන්ත පිළිබඳ ව |
| **සිතුල්පව්ව සෙල්ලිපිය** | - අධිකරණයෙන් ලබන ආදායම ප්‍රදේශයේ වූ විහාරයට හිමි වීම හා කාල නිර්ණය පිළිබඳ ව ශිලා ලේඛනවලින් ලැබෙන තොරතුරුවල පිටුබලය ඉතා වැදගත් ය. |


සෙල්ලිපි මගින් අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනගා ගත නොහැකි වුවත්, ඒ සඳහා විශාල දායකත්වයක් ලබා ගත හැකි බව පැහැදිලි කරුණකි.

## කාසි (නාණක මූලාශ්‍රය)

පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අතර තවත් වැදගත් අංශයක් වන්නේ, කාසි ය. කාසිවලින් එක් එක් යුගවල ආර්ථිකයේ දියුණුව හා තාක්ෂණික දියුණුව පිළිබඳ තොරතුරු දැනගත හැකිය. රන්, රිදී, තඹ කාසි නිකුත් වී ඇත්තේ ඒ අනුවයි.

හස් එබූ කාසි, පුරාණ, ධරණ, ඇතා හා බෞද්ධ ස්වස්තික හා ලක්ෂ්මී කාසි, දඹදෙණි තඹ මසු, රන් මසු, රන් අඩමසු, ලැරිනය, (වී.ඕ.සී (VOC) කාසි) වැනි කාසි අතීතයේ පටන් විවිධ යුගවල මෙරට භාවිත වී ඇත.

විදේශීය කාසි වර්ග කිහිපයක් ද ලංකාවෙන් හමු වී ඇත. රෝම කාසි, ඉන්දුරෝම කාසි, චීන කාසි ඒ අතර වැදගත් වේ. එමෙන් ම මහාපරාක්‍රමබාහු රජතුමාගේ කාසි දකුණු ඉන්දියාවෙන් සොයාගෙන ඇත.




**රූපය 1.4 - පුරාණ කාසි**

**කාසි :**
01. කේසර රහිත සිංහ වර්ගයේ රවුම් තඹ කාසිය
02. කසාපණ හෝ පුරාණ (රිදී කාසි)
03. රවුම් තඹ කාසි - ගස සහ ස්වස්තික වර්ගය
04. දිගටි තඹ කැබැල්ල - දේවතාවියකගේ හිටි රූපය.(ලක්ෂ්මී දෙවඟන)
05. අලියා සහ ස්වස්තිකය වර්ගයේ ලොකු රවුම් තඹ කාසිය.
06. චතුරස්‍රාකාර බෞද්ධ චක්‍රවර්ති වර්ගයේ තඹ කාසිය
07. සෘජුකෝණාස්‍රාකාර තඹ කාසිය
08. ඉන්දු රෝම රන් කාසිය
09. ඉරු සඳ වර්ගයේ මධ්‍යතන යුගයේ රන් කහවණු.
10. හක්ගෙඩිය සහ දෑසමන් මල් වර්ගයේ රනින් කළ දැක හෝ ඵල කාසිය.
11. රාජරාජ චෝළ රජුගේ ලංකා වර්ගයේ රන් කාසිය.
12. පළමුවන විජයබාහු රජුගේ රන් කහවනුවක්
13. මහා පරාක්‍රමබාහු රජුගේ රිදී මස්ස
14. යාපනයේ ආර්ය චක්‍රවර්තිගේ තඹ කාසිය
15. හයවන පරාක්‍රමබාහු රජුගේ තඹ මස්ස

කාසි පිළිබඳ අධ්‍යයනය කිරීම නාණක විද්‍යාව යනුවෙන් හැඳින්වේ. ඊට කාසිවල ප්‍රභවය, සංවර්ධනය, විවිධ කාසි මුද්‍රණය, ලෝහ විද්‍යාව කාසිවල මුදල්මය අගය යනාදී අංග ඇතුළත් ය. විවිධ ලෝහ වර්ගවලින් කාසි තැනීම මගින් ලෝහ කර්මාන්තය පිළිබඳ දැනුමක් ලබා දෙන අතර පැරණි තාක්ෂණය පිළිබඳ ව අවබෝධයක් ද ලබා දෙයි. එසේම කාල නිර්ණය කිරීම සඳහා ද විශාල පිටුබලයක් එයින් ලැබේ.

## නටබුන්

ගොඩනැගීම්වල ශේෂ ව ඇති කොටස් නටබුන් ලෙස හඳුන්වනු ලැබේ. ලංකාවේ බොහෝ ස්ථානවලින් ඓතිහාසික වටිනාකමින් යුත් නටබුන් හමු වී ඇත.

උදා : අනුරාධපුරය, පොළොන්නරුව, යාපහුව නගරයක හෝ ගමක ඓතිහාසික වර්ධනය අවබෝධකර ගැනීමට නටබුන් උපකාරී වේ. නගර හා ගම් දිවයිනේ ව්‍යාප්ත ව තිබූ අයුරු පිළිබඳ නටබුන් මගින් අවබෝධයක් ලබාගත හැකි ය.

පැරැන්නන් විසින් කවර තාක්ෂණයක් යොද ගෙන කුමන ගොඩනැගිලි තනවන ලද්දේ දැයි තේරුම් ගැනීමට ඇති ප්‍රධාන මූලාශ්‍රය නටබුන් ය. ජල පරිපාලනය. පරිසර සැකැස්ම ආදිය අධ්‍යයනය කිරීමට ඇති ප්‍රායෝගික මූලාශ්‍රය ද මෙයයි.

නටබුන් අතරින් සීගිරියට ප්‍රමුඛ තැනක් ලැබේ. ආරක්ෂක බලකොටුවක් ලෙස සිගිරියේ ඉදිකිරීම, ජල තටාක, උද්‍යානය, පර්වත මුදුනේ ඇති රාජමාලිගය, සීගිරි චිත්‍ර, නාන තටාක දුටුවන් මවිත කරවයි. ඒ අනුව තාක්ෂණය භාවිතය, සැලසුම් සහගතබව, සෞන්දර්යාත්මකභාවය, උද්‍යාන නිර්මාණය ඉතා උසස් මට්ටමක පවතී. මේ නිසා සීගිරිය ලොව අටවන පුදුමය ලෙස ද ඇතැම්හු හඳුන්වති.

මූර්ති, කැටයම් හා චිත්‍ර ආදිය සංස්කෘතික ඉතිහාසය පිළිබිඹු කරන ජීවමාන සාධක වේ. මිනිසා විසින් අගය කරන ලද දේ, ආගමික විශ්වාස, ඇඳුම් පැලඳුම්, ආභරණ ආදිය පිළිබඳ අධ්‍යයනය කිරීමට ඇති වැදගත් ම සාධක මේවා වේ.

කැටයම් හා මූර්ති තනා ඇති අමුද්‍රව්‍ය අධ්‍යයනය කිරීමෙන් එදා පැවති විවිධ පාෂාණ වර්ග හා ඒවා නිර්මාණකරණයේ දී භාවිත කරන ලද තාක්ෂණය ආදී ශිල්ප ක්‍රම අවබෝධ කරගත හැකිය.

විදේශීය සබඳතා පිළිබඳ තොරතුරු ලබාගැනීමට ද මෙම පුරාවස්තු උපකාරී වේ.



**රූපය 1.5 - සීගිරිගල**

බලකොටුවක් ලෙසින් සීගිරිය යොද ගැනීම, සතුරු ආක්‍රමණ මැඩ පැවැත්වීමට හා පහසුව සඳහා ජල උද්‍යානය ඉදිකර තිබීම.




**රූපය 1.6 - සීගිරි උද්‍යානය**

මේ අලංකරණය සඳහා ඉදිකර ඇති අතර එය ඉතා ම සෞන්දර්යාත්මක ව ගොඩනගා ඇත. එමෙන් ම සීගිරි ගුහාවල ඉතා සෞන්දර්යාත්මක චිත්‍ර ඇත.




**රූපය 1.7 - සීගිරි චිත්‍ර**

මෙම චිත්‍ර, ඉන්දියාවේ අජන්තා චිත්‍රවලට සමවීම ඇසුරින් දෙරට අතර ඇති සබඳතා පිළිබිඹු වේ.



**රූපය 1.8 - මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි ගල්කණුවල කැටයම්**



**රූපය 1.9 - නටරාජා ලෝකඩ පිළිමය**

## ක්‍රියාකාරකම්

- ✍ ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍ර පිළිබඳ ලේඛනයක් සකස් කරන්න.
- ✍ ඓතිහාසික මූලාශ්‍රවල වැදගත්කම යන මාතෘකාව යටතේ වාර්තාවක් සකස් කරන්න.

## අභ්‍යාස

පිළිතුරු සපයන්න

1. ඉතිහාසය යනු කුමක් ද?
2. ඉතිහාසය ඉගෙනීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන 4ක් ලියන්න
3. ඓතිහාසික මූලාශ්‍රය යනු කුමක් ද?

## සාරාංශය

- ✍ මානව ඉතිහාසයේ කතන්දරය ඉතිහාසය යනුවෙන් හැඳින්වේ.
- ✍ සෑම විෂයක ම නිවස ඉතිහාසයයි.
- ✍ ලෝකය පිළිබඳ දැනුම, වර්තමානය තේරුම්ගැනීම, ජාත්‍යාලය ඇති කර ගැනීම, අන් සංස්කෘතීන්ට ගරු කිරීම, විවේචනාත්මක චින්තනයේ වර්ධනය ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ලැබෙන ප්‍රායෝජන අතර වැදගත් වේ.
- ✍ සාහිත්‍යමය මූලාශ්‍රය, සෙල්ලිපි. කාසි, නටබුන් යන මූලාශ්‍රය ඉතිහාසය ගොඩනගා ගැනීමට අවශ්‍ය වේ.
- ✍ වසර 2500 වඩා පැරණි අඛණ්ඩ ලිඛිත ඉතිහාසයක් ලංකාව සතු ය.

## වැඩිදුර කියවීමට පොත්

- ☞ ශ්‍රී ලංකාවේ ඉතිහාසය 1 කොටස - අනුරාධපුර යුගය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- ☞ අනුරාධපුර යුගය - අමරදාස ලියනගමගේ - රණවීර ගුණවර්ධන
- ☞ සංක්ෂිප්ත ලංකා ඉතිහාසය - සී. ඩබ්ලිව්. නිකලස් - ඇස්. පරණවිතාන